ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : පීඑස්/සීඑස්ජ්/00/1/4/8 චක්‍රලේඛ අංකය : පීඑස්/සීඑස්ජ්/චක්‍රලේඛ/4/2023

2023 පෙබරවාරි මස 22 වන දින

අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
සියළුම අමාත්‍යාංශ ලේකම්වරු
සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
පාර්ලිමේන්තු මහලේකම්

**රාජකාරි විදේශ සංචාර සඳහා ගුවන් ටිකට්පත් මිලදී ගැනීම**

වර්තමානයේ රටේ පවත්නා ආර්ථික හා මූල්‍ය දුෂ්කරතා මත රජයේ අරමුදල් අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා පමණක් ඉතා අරපිරිමැස්මෙන් යුතුව වැය කළ යුතුය.

02. ඒ අනුව, රාජකාරි විදේශ සංචාර සඳහා ගුවන් ටිකට්පත් මිලදී ගැනීමට රජයේ අරමුදල් භාවිතා කරනු ලබන අවස්ථාවලදී, ගරු අගවිනිසුරුතුමන්, ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමන්ලා, ගරු අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ ගරු අභියාචනාධිකරණ විනිසුරුතුමන්ලා හැර, අනිකුත් සියළුම නිලධාරීන් පිරිමැසුම් පංතියේ (Economy Class) ගුවන් ටිකට්පත් පමණක් මිලදී ගත යුතු බව ගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

03. යම් නිලධාරියෙකුට ව්‍යාපාරික පංතියේ (Business Class) ගමන් කිරීමට අවශ්‍ය වන්නේ නම්, පිරිමැසුම් පංතියේ ගුවන් ටිකට්පතක් මිලදී ගැනීමට යන මුදල සහ ව්‍යාපාරික පංතියේ ගුවන් ටිකට් පතක් මිලදී ගැනීමට යන මුදල අතර වෙනස සිය පෞද්ගලික මුදලින් වැයකර ව්‍යාපාරික පංතියේ ගමන් කිරීමට හැකියාව ඇත.

04. යම් නිලධාරියෙකුට ඉහත විධිවිධාන වලට පරිබාහිරව සුවිශේෂී හේතුවක් මත රජයේ අරමුදල් භාවිතා කර ව්‍යාපාරික පංතියේ ගමන් කිරීමට අවශ්‍ය වන්නේ නම්, ඒ පිළිබඳ ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කර මාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

05. මෙම චක්‍රලේඛයෙහි සඳහන් විධිවිධාන 2023 මාර්තු මස 01 වන දින සිට බලාත්මක වන අතර, ඒ අනුව මෙම කරුණට අදාලව මීට පෙර නිකුත් කර ඇති චක්‍රලේඛ හෝ උපදෙස් ලිපි වල සඳහන් විධිවිධාන එදින සිට බලරහිත වේ.

06. මෙ පිළිබඳව ඔබ අමාත්‍යාංශය / පළාත් සභාව / ආයතනය යටතේ ඇති සියළුම පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ අනෙකුත් ආයතන ප්‍රධානීන් දැනුවත් කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

ඊ.එම්.එස්.බී. ඒකනායක
ජනාධිපති ලේකම්

පිටපත : විගණකාධිපති

මෙම රාජ්‍ය පරිපාලන/රාජ්‍ය ..................../
..................................චක්‍රලේඛය / උපදෙස්
ලිපිය ......... දින සිට
ගරු ........ අනුමැතිය 2023-03-13
..........

ගාලු මුවදොර, කොළඹ 01
Galle Face, Colombo 01
දුරකථන Telephones ++ 94 (0) 11 2354418 ++ 94 (0) 11 2473873
ෆැක්ස් Fax ++ 94 11 2446657
ඊ-මේල් e-mail prsec@presidentsoffice.lk